Sri Lanka POST
ශ්‍රී ලංකා තැපැල් · இலங்கை அஞ்சல்

තැපැල් මූලස්ථානය, 310 ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ 01000
அஞ்சல் தலைமையகம், 310, டீ. ஆர். விஜேவர்த்தன மாவத்தை, கொழும்பு 01000
Postal Headquarters, 310, D. R. Wijewardana Mawatha, Colombo 01000

තැපැල් දෙපාර්තමේන්තුව
அஞ்சல் திணைக்களம்
Department of Post

මගේ අංකය / எனது இலக்கம் / My No. POST/Hq/OP/ICT/SA/WEB/464/2024
ඔබේ අංකය / உமது இலக்கம் / Your No.
දිනය / திகதி / Date 2024/03/13

## මාධ්‍ය නිවේදනය

රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂක ජනරාල්,

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

### සල්ලි ඉල්ලන කෙටි පණිවුඩය තැපෑලෙන් නොවේ.

පාර්සලයක් සඳහා ගාස්තු ගෙවන ලෙස දන්වා ශ්‍රී ලංකා තැපෑලෙන් නිකුත් කළ කෙටි පණිවුඩයක් ලෙස ව්‍යාජ ලෙස සකස් කළ කෙටි පණිවුඩයක් මහජනතාව වෙත යවා ණය කාඩ්පත් දත්ත සොරකම් කිරීමේ ජාවාරමක් අනාවරණය වී ඇත.

ශ්‍රී ලංකා තැපෑල, ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුව, SL POST, Sri Lanka Post ආදී නම් යොදා ගනිමින් ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය ද උපක්‍රමිකව අවභාවිතා කරමින් මෙම ජාවාරම ක්‍රියාත්මක වේ.

ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුව කෙටි පණිවුඩ මඟින් ණය කාඩ්පත් තොරතුරු විමසීමක් කිසිසේත් සිදු නොකරන අතර ණය කාඩ්පත් මඟින් පාර්සල් සම්බන්ධ කිසිදු ගණුදෙනුවක් සිදු නොකෙරේ.

මහජනතාව වෙත ලැබෙන කෙටි පණිවුඩයක් සඳහා සිය ණය කාඩ්පත් දත්ත වෙබ් අඩවියකට හෝ කෙටි පණිවුඩයක් මඟින් හෝ වෙනත් කිසිදු ආකාරයකින් ලබාදීම සිදු නොකරන ලෙස ජනතාව දැනුවත් කිරීම සඳහා සියළු මාධ්‍ය ආයතන වෙත දැනුවත් කරන මෙන් කාරුණිකව ඉල්ලමි.

තව ද, මේ සම්බන්ධයෙන් විමසීම් සිදු කිරීමට පහත දුරකථන අංක ප්‍රසිද්ධ කරන ලෙස ද කාරුණිකව ඉල්ලමි.

තැපැල් දෙපාර්තමේන්තු උපකාරක සේවාව 1950, තොරතුරු තාක්ෂණ අංශය 011 2542104, 011 2334728, 0112335978, 0112687229, 0112330072

එස්.ආර්.ඩබ්.එම්.ආර්.පී. සත්කුමාර
තැපැල්පති


| | දුරකතන අංක | ෆැක්ස් අංක | විද්‍යුත් තැපෑල |
|---|---|---|---|
| තැපැල්පති | 0112-325111 | 0112-440555 | pmg@slpost.lk |
| නියෝජ්‍ය තැපැල්පති (මෙහෙයුම්) | 0112-325112 | 0112-421441 | dpmg.op@slpost.lk |
| නියෝජ්‍ය තැපැල්පති (සංවර්ධන) | 0112-328270 | 0112-421441 | dpmg.dev@slpost.lk |
| නියෝජ්‍ය තැපැල්පති (පාලන) | 0112-421001 | 0112-452411 | dpmg.admin@slpost.lk |
| ප්‍රධාන ගණකාධිකාරී | 0112-320248 | 0112-329797 | ca@slpost.lk |
| තැපැල් මූලස්ථානය | 0112-328301-3 | | info@slpost.lk |